# 1.8 අප්‍රිකානු සමාජය තුළ සැබෑ කාන්තා ප්‍රතිරූපය ලොවට හෙළි කරන මරියාමා බා (Mariama Bâ )ගේ සාහිත්‍ය කෘති

දිනූෂා ඉලේපෙරුම
නූතන භාෂා අධ්‍යයන අංශය (ප්‍රංශ), කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

අප්‍රිකානු ජන සමාජය තුළ කාන්තාවට නිරන්තරයෙන්ම හිමි වූයේ දෙවෙනි ස්ථානයයි. ලේඛන කලා ලෝකය ද ගත්කතුවරුන් විසින් ආක්‍රමණය කර තිබූ අතර, කාාන්තාව ලේඛන කලාවට අවතීර්ණ වීමට දිගු කලක් ගතවිය. පුරුෂ පාර්ශවය විසින් බහුල වශයෙන් යටත් විජිතවාදය, දේශානුරාගය, කලු සුදු භේදය හා කාන්තාවගේ සාහිත්‍යමය සුන්දර ප්‍රතිරූපය විෂය මූලික කරගත්ත ද කිසි විටකත් සිය සමාජයේ කාන්තාවට හිමි ස්ථානය, ඇයට සිදුවන අසාධාරණත්වය හා ඇගේ දුක්බර ජීවිතය ගැන කථා බහට ලක් නොකළේ ය.

සෙනෙගාල් ජාතික මරියාමා බා ( Mariama Bâ ) හට අප්‍රිකානු සාහිත්‍ය තුළ ප්‍රකට ස්ථානයක් හිමි වන්නේ සිය සමාජය තුළ කාන්තාවගේ සැබෑ ප්‍රතිරූපය හා ඈ අත් විඳින දුක් ගැහැට තෙලි තුඩගින් හෙළි කළ ප්‍රථම කාන්තාව වන නිසාය. ඇගේ සාහිත්‍ය කලා දිවිය තුළ ඈ විසින් රචිත සාහිත්‍යය කෘතින් ප්‍රමාණය දෙකක් වැනි සුළු ප්‍රමාණයක් වුවද ඇගේ කුළුඳුල් නිර්මාණය වන " එක් දිගු ලිපියක් " (*Une si longue lettre*) සමාජයේ ක්‍රියාත්මක හා අන් ලේඛක යන් විසින් නිරූපණය කිරීමට මැලි වූ බහුවිවාහය, කුලය, ඉස්ලාම් ආගම, කාන්තා අධ්‍යාපනය වැනි දැවෙන මාතෘකා විවේචනයට ලක්කළා ය. ඉස්ලාම් අගමික වටපිටාවක් මධ්‍යයේ ඇති දැඩි වන ඇය ප්‍රංශ භාෂාවෙන් අධ්‍යාපනය ලැබුවා ය. ප්‍රධාන චරිතය වන රාමතුලයි විසින් ළමා වියේ සිටම ඇගේ කල්‍යාණ මිතුරිය වූ අයිසතු වෙත යවන දිගු හසුනක මෙම කථා පුවත දිග හැරෙන්නේ ය. රාමතුලයිගේ චරිතයෙන් කතුවරිය තම ළමා කාලයේ හා විවාහ ජීවිතයේ ඇය විසින් අත් විඳි සියලු අත්දැකීම් ද තම කුළුඳුල් නිර්මාණයට පාදක කරගෙන ඇත. එමෙන් ම ඇය සිය ස්වාමියාගේ කැමැත්තට ඉඩ දි දරුවන් නව දෙනෙකුගේ සියලු බර හා වගකීම් ද තනිවම උසුලාගෙන ජීවිතය ජයගන්නා අභීත කාන්තාවකගේ චරිතය නිරූපණය කරන්නේ අපූරු අන්දමිනි. තවද, ඇය සිය මිතුරියගේ චරිතය ද, ඇය ජිවත් වු පරිසරයේ ඇයට හමු වූ අන් චරිත ද මෙම කෘතියේ ප්‍රධාන භූමිකාවන් දරන්නා සේ ම ඔවුන් තුළින් ද පිළිඹිබු වන සංස්කෘතික හා සමාජීය ලක්ෂණ වලින් යුක්තය.

මරියාමා බා විසින් රචිත කෘතින් දෙක අතරින් අපගේ විශේෂ අවධානයට යොමුවන්නේ ඇගේ කුළුඳුල් නිර්මාණයෙන් නිරූපණය වන සෙනෙගාල් සමාජය තුළ පවතින බහුවිවාහ ප්‍රශ්නය, ආගම, කුලය, අධ්‍යාපන ක්‍රමය තුළ කාන්තාව මුහුණ දෙන අයුරුය. මෙම සමාජීය සංස්කෘතික සාධකයන් එම සමාජය තුළ කෙතරම් දරුණුව ක්‍රියාත්මක වන්නේ ද, ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශවය අතර ඇති සම්බන්ධතාවයන් ද ඔවුනටම වෙන් වූ යුතු අයුතුකම් මහා පවුරකින් වෙන් වී ඇති ආකාරයක් පෙන්නුම් කරන අතර ඉන් වැඩි වශයෙන් බැටකන්නේ කාන්තාවයි. මරියාමා බා ගේ සාහිත්‍ය කෘති වලින් නිරූපිත කාන්තාව ලාංකීය ජන සමාජයේ නොසිටින්නේ ද ?